ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2021 - 11 - 12

පැමිණිලි පාර්ශවය : ආර්. ජ්. ප්‍රියන්ත මහතා,
297/2, 5 වන පටුමග,
මිහිදුගම, රත්නපුර.

වගඋත්තරකාර පාර්ශවය : 01. විදුහල්පති,
ෆර්ගසන් ජාතික පාසල,
රත්නපුර.

02. ජාතික පාසල් අධ්‍යක්ෂ,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

04. රෝහණ ගමගේ මයා,
(2018 වසරට ළමුන් ඇතුළත් කිරීමේ අභියාචනා කමිටුවේ සභාපති),
දෙහිඕවිට ජාතික පාසල,
දෙහිඕවිට.

පැමිණිලි අංකය : **HRC/195/18**

**පැමිණිලිකරුගේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකරු විසින් 2018-01-17 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම දරුවා වන සදලි සත්සරා රාජපක්ෂ වගඋත්තරකාර විද්‍යාලයේ 2018 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට

ආසන්නතා පදනම යටතේ අයදුම් කළ බවත්, කැඳවීම් අංක CHO 273 යටතේ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලකුණු 90ක් උපයා ගත් බවත්ය. තමාට විරුද්ධව විරෝධතා ඉදිරිපත් වී ඇති බැවින්, අභියාචනා කමිටුවටද ඉදිරිපත් පත් වීමෙන් පසු අභියාචනා කමිටුවේ සභාපති ලකුණු වෙනසක් සිදු නොවන බවට පැමිණිලිකරුගේ ලේඛණයේ සටහන් කරන ලද බවට දක්වා ඇත. අභියාචනාවට කැඳවීමෙන් පසු එනම්, දින 28කට පසුව නැවත ලකුණු වෙනසක් සිදු වන බව දන්වන ලද අතර, චක්‍රලේඛන ප්‍රකාරව එසේ ලකුණු වෙනසක් සිදු කළ යුත්තේ සති 02ක් ඇතුළත බව පැමිණිලිකරු වැඩිදුරටත් කොමිෂන් සභාව වෙත සදහන් කරඇත. එසේ නීතිවිරෝධීව තමාගේ ලකුණු වෙනස් කර ඇති බැවින් හා තම දරුවා පාසලට තෝරා නොගැනීමෙන් තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පැමිණිලිකරු කොමිෂන් සභාවට දන්වා ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තරකරු සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිලිකරු ආසන්නතා පදනම මත CHO 273 යටතේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලකුණු 90ක් උපයා ගත් බවත්, මෙම පැමිණිලිකරුට විරෝධතා ලැබී ඇති බැවින්, අභියාචනා කමිටුවට කැඳවන ලද අතර, අභියාචනා කමිටුවේ සභාපති ලකුණු වල කිසිදු වෙනසක් සිදු නොවන බවට දන්වා පැමිණිලිකරු වෙත එය ලිඛිත ලබා දී ඇති බවත්ය. අනතුරුව අභියාචනා කමිටුවට කැඳවීමෙන් දින 28කට පසු ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමෙන් පැමිණිලිකරු උපයාගෙන ඇති ලකුණු 90න් ලකුණු 05ක් එක් පාසලක් සඳහා අඩු කළ බවත්, ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා පාසලට ඇතුළත් කර ගැනීමේ අවම ලකුණු සීමාවට වඩා ලකුණු 05ක් අඩු බැවින්, පාසලට ඇතුළත් කර ගැනීමට හැකියාවක් නොමැති බවත්ය.

**කොමිෂන් සභාව හමුවේ අනාවරණය වූ කරුණු :-**

දෙපාර්ශවය විසින්ම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ලිඛිත හා වාචික කරුණු ඉදිරිපත් කර ඇති අතර, එම සියළු කරුණු සලකා බැලීමෙන් අනතුරුව පහත කරුණු අනාවරණය වී ඇත.

පැමිණිලිකරු ආසන්නතා පදනම යටතේ CHO 273 යටතේ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලකුණු 90ක් උපයාගෙන ඇති බව නිරීක්ෂණය වේ. තවද පැමිණිලිකරුට විරෝධතා ඇති බැවින්, අභියාචනා මණ්ඩලය හමුවේ පෙනී සිට ඇති අතර, අභියාචනා කමිටුවේ සභාපතිවරයා ඒ අවස්ථාවේදි ලකුණු වෙනසක් සිදු නොවන බව පැමිණිලිකරුට ලබා දෙන ලේඛනයේ සටහන් යොදා ඇති බවද නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය වන අභියාචනා කමිටුවේ සභාපතිවරයා විසින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ඇති බවට සඳහන් කර ඇති නමුත් එම ස්ථානීය පරීක්ෂණය සිදු කල බවට කොමිෂන් සභාවට වෙත ලිඛිතව කරුණු ඉදිරිපත් කර නොමැති බව ලේඛන නිරීක්ෂණය කිරීමේදී අනාවරණය වේ.

අභියාචනා කමිටුවට ඉදිරිපත් වී දින 28කට පසු පැමිණිලිකරුගේ ලකුණු 05ක වෙනසක් සිදු වන බව දන්වා ඇති අතර. පාසලට ළමුන් ඇතුලත් කර ගැනීමට දින 03ක් තිබියදී මෙසේ දන්වා ඇති අතර. චක්‍රලේඛන ප්‍රකාරව එසේ ලකුණු වෙනසක් සිදු වන්නේ නම්. සති 02ක් ඇතුලතදී දැනුම් දීම සිදු කළ යුතු වුවත්. වගඋත්තරකරුවන් චක්‍රලේඛයේ දක්වා ඇති කරුණු වන "12.1.1 අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් අභියාචනා හා විරෝධතා පරීක්ෂා කිරීමෙන් පසු අවසාන ලැයිස්තුව සැකසිය යුතුය. මෙහි දී ලකුණුවල වෙනස්කමක් සිදු වන්නේ නම් තාවකාලික ලැයිස්තුවේ නිසි තැනට අභියාචනාකරුවන් හා විරෝධතාවට ලක් වූ/ දැක් වූ අය ඇතුලත් කොට නැවත සංශෝධිත තාවකාලික ලේඛනය සකස් කළ යුතු ය. ඒ අයුරින්ම පොරොත්තු ලේඛනය ද සංශෝධනය කර සකස් කළ යුතුය." අනුව කටයුතු කර නොමැති බව අනාවරණය වේ.

තවද චක්‍රලේඛයේ 12.4.2 අනුව "දැන්වීම් පුවරුවේ යොදන ලේඛන දෙක (අවසාන ලැයිස්තුව හා අවසාන පොරොත්තු ලේඛනය) සති දෙකක්වත් අඛණ්ඩව ප්‍රදර්ශනය කළ යුතුය. මෙම ලේඛන අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ අත්සන් (12.4.1 හි උපදෙස්වලට අනුකූලව) නොමැතිව ප්‍රසිද්ධ කිරීම නොකළ යුතුය." වශයෙන් දක්වා ඇත.

ඉහත කරුණු සියල්ල සලකා බැලීමේදී විශේෂයෙන් පෙනී යන්නේ අභියාචනා මණ්ඩලයට චක්‍රලේඛ අභිබවා කටයුතු කර ඇති අතර. එකී වැරදිසගත ක්‍රියාවලිය තුලින් සිදු වී ඇති නිවැරදි නොවන ලකුණු අඩු කිරීමක් හේතුකොටගෙන වගඋත්තරකාර පාර්ශවය අත්තනෝමතිකව ක්‍රියා කර ඇති බවයි.

අභියාචනා මණ්ඩලයේ එකී නීතිවිරෝධී සහ ප්‍රශ්නගත ලකුණු වෙනස් කිරීම තුලින් පැමිණිලිකරුගේ දරුවාට පාසලට ඇතුලත් වීමට තිබූ අයිතිය අවසාන මොහොතේදී වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට ඉදිරිපත් කර ඇති ලේඛන අනුව පැහැදිලිව පෙනී යන කරුණකි.

**නිරීක්ෂණය =:**

ඒ අනුව පාර්ශවයන් ඉදිරිපත් කර ඇති සියළුම ලිපිලේඛන සහ වාචික කරුණු සලකා බැලීමෙන් පසු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පහත නිගමනයන්ට එළඹිණි.

මෙකී සමස්ථ කරුණු අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් වගඋත්තරකරුවන් ක්‍රියා කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පැමිණිලිකරුගේ දරුවා වන සඳලි සත්සරා රාජපක්ෂ වගඋත්තරකාර විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුලත් කර ගැනීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.12.31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ.නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/- Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

පිටපත :- ගරු අමාත්‍යතුමා.
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය.
බත්තරමුල්ල.